සුධර්මාවතී-, ජේ.එම්.
ඉතිහාස අධ්‍යයන අංශය

*Paper: Transformability*

# ක්‍රි.ව. 12 වන සියවසේ මෙරට ඇති වූ නව දේශපාලන ප්‍රවණතාව (දඹදෙණි යුගය ඇසුරින්)

ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය කරමින් සිදු කරන ලද මෙම පර්යේෂණයට අදාළ කාල පරිච්ඡේදය වූයේ මාඝ ආක්‍රමණයේ සිට දඹදෙණි රාජධානියේ බිඳවැටීම දක්වා වූ කාලයයි.

ලාංකිකයන්ගේ උරුමය ශ්‍රේෂ්ඨ අන්දමින් ලොවට පෙන්වා දෙන අනුරාධපුරය, පොළොන්නරුව කේන්ද්‍ර කරගෙන පැවති රජරට ශිෂ්ටාචාරය පොළොන්නරු රාජධානියේ බිඳවැටීමත් සමඟ නිමාවට පත්විය. පළමුවන පරාක්‍රමබාහු රජුගේ අභාවයෙන් පසු දිවයිනේ දේශපාලන තත්ත්වය අයහපත් අතට හැරෙමින්; මධ්‍ය පාලනයේ ඇති වූ දුර්වලතාව හේතු කොටගෙන අවසානයේදී පොළොන්නරු රාජධානිය ප්‍රබල ආක්‍රමණයකට ගොදුරු විය. මෙම ආක්‍රමණය මෙහෙය වූයේ විශාල සේනාවක් සමඟ දකුණු ඉන්දියාවේ කාලිංගයේ සිට පැමිණි මාඝ නැමැත්තෙකි. මෙම ප්‍රබල හමුදාව පෙර නොවූ විරූ අන්දමින් පොළොන්නරු රාජධානියට අතිශය බිහිසුණු විනාශකාරී ප්‍රහාර එල්ල කොට විශාල ව්‍යසනයක් ලංකාව තුළ ඇති කළේ ය. මොහුගේ මේ විනාශකාරී ප්‍රතිපත්තිය නිසා ලංකාව අරාජිකත්වයට පත්විය. එයින් පීඩාවට පත් වූ රජදරුවන්, මැති ඇමැති ආදී වූ ප්‍රධානීන් රජරට අතහැර දමා රැකවරණය පතා දිවයිනේ දකුණු දිග හා නිරිතදිග ප්‍රදේශයන්ට සංක්‍රමණය වූ බව *හත්ථවනගල්ල විහාරවංසයේ* සඳහන් වේ. මෙනිසා රජරට ජනශූන්‍ය තත්ත්වයට පත්විය. මාඝ, සිය පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව පවත්වාගෙන යමින් වසර 40 ක් පමණ දීර්ඝ කාලයක් මෙරට රැඳී සිටීමට සමත් වූයේ ය.

මාඝ ආක්‍රමණය හා ඔහු මෙරට දීර්ඝ කාලයක් රැඳී සිටීම නිසා එතැන් පටන් ලංකාවේ දේශපාලන පසුබිම සකස් වූයේ සමස්තයක් වශයෙන් නොව හුදකලා ඒකක වශයෙනි මෙබඳු වාතාවරනයක් තුළ රුහුණු, මායා දෙරට තුළින් නායකත්ව බිහි වූ ආකාරය මූලාශ්‍රය සඳහන් කරයි. ප්‍රධාන වශයෙන් ස්ථාන තුනක් කේන්ද්‍ර කරගෙන හුදකලා නායකත්වයන් ඉස්මතු වී තිබේ. කෙසේ වෙතත්, මෙම තත්ත්වයට වෙනස් අන්දමේ නව ප්‍රවණතාවයක් ද ඇති විය. ඒ 'වන්නි රාජ' හෙවත් 'වන්නි නිරිඳු' යන නමින් නායකයින් බිහි වීමයි. *මහාවංසය, පූජාවලිය* වැනි මූලාශ්‍රය පළමුවරට මෙම නායකත්වයන් ගැන සඳහන් කරනුයේ තුන්වන විජයබාහු රජු සම්බන්ධ ප්‍රවෘත්තීන්හිදී ය. මුලදී කුඩා පාලන ඒකකයක් පිහිටුවා ගැනීම තුලින් ඇරඹි මෙම පාලනය දඹදෙණි යුගයේදී දිවයින පුරා ව්‍යාප්ත වීමක ආරම්භය පෙන්නුම් කරයි.

වන්නි නායකයන්ගේ නැගීසිටීමක් සිදු වූයේ තුන්වන විජයබාහු රජු දඹදෙණිය කේන්ද්‍ර කරගනිමින් මායා රටේ නායකත්වයක් ඇති කරගැනීමේදීය. දඹදෙණි රාජධානියේ පාලකයන් හමුවේ තිබූ ප්‍රධාන අභියෝගය මාඝ පලවා හැරීම වූ අතර මොවුන් ද ප්‍රාදේශීය නායකත්වය තුළින් නැගී ආවත් අනෙක් පිරිස් යටත් කර ගැනීමට ඔවුන්ට මහත් ප්‍රයත්නයක් දැරීමට සිදුවිය. දඹදෙණි පාලකයෝ විදේශ ආක්‍රමණ කීපයකට ද මුහුණ දුන්හ. මේ සියලු අභියෝග ජයගනිමින් ලාංකිකයන්ට සාමකාමී දේශපාලන වාතාවරණයක් උදා කර දීමට ඔවුහු සමත් වූහ. වන්නිවරුන් සිය බලය වර්ධනය කරගනිමින් ශක්තිමත් ප්‍රබල නායකත්වයක් පවත්වාගෙන යෑමට සමත් වූ බව කෝට්ටේ ලාංකීය හයවන පරාක්‍රමබාහු රාජසමයේදී පෙන්නුම් කරයි. ලාංකීය ඉතිහාසයේ දඹදෙණිය නමින් කාලපරිච්ඡේදයක් ඇති කිරීමෙහි ගෞරවය වන්නිවරුන්ට හිමිවන බව නිගමනය කළ හැකිය.